# මංසලක පා තැබූ ගැමි දිවිය

## නව ජනාවාස ගැන නෙත් යොමු කිරීමක්

(පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි ආචාර්ය ජයන්ත පතිරණ විසිනි.)

ලංකාවේ මෙතාක් කල් දියත් කරන ලද විශාලතම වාරිමාර්ග ජනාවාස ක්‍රමය හා සංවර්ධන වැඩ සටහන මහවැලි සංවර්ධන ව්‍යාපාරයයි එම ව්‍යාපාරය නව අවුරුදු පහකින් විතර සම්පූර්ණ කරන විට ලක්ෂ පහළොවකට විතර පුංචි ගොවි පවුල් වශයෙන් මේ ව්‍යාපාර ප්‍රදේශයේ පදිංචි වීමට ඉඩ සැලසේ. මෙම යළි පදිංචි කරවීමේ වැඩ කටයුතු සංවර්ධන අඩවි වශයෙන් බෙද කරගෙන යයි. දැනට 'එච්' නම් අඩවියේ සංවර්ධන හා පදිංචි කිරීමේ කටයුතු සම්පූර්ණ කොට ඇත. ඒ සමගම 'බී' සහ 'සී' යන අඩවි වලද සංවර්ධන කටයුතු දැනටමත් ආරම්භ කොට ඇත.

මහවැලි ව්‍යාපාරය පටන් ගන්නා තුරු ලංකාවේ අළුත් ජනපද ඇති කිරීමේදී කැලෑ කපා බිම් පෙරලා ගෙවල් සාද පිටතින් මිනිසුන් ගෙනැවිත් කටයුතු ආරම්භ කිරීම සිරිත විය. එහෙත් මහවැලියේ 'එච්' අඩවියේ සංවර්ධන කටයුතු හා යළි පදිංචි කිරීමේ ව්‍යාපාර ඇරඹුනේ එම කටයුතු පටන් ගැනීමට බොහෝ කලක සිට ඒ ප්‍රදේශයේ පුරාණ ගම් ද පුනරුත්ථාපනය කර මිනි.

පුරාණ ගමක මූලික පෙනුම ගැන අපි කවුරුත් අසා ඇත්තෙමු. ගමේ කුඩා වැව, වැවට යටින් කුඹුරු, වැව අද්දර ගම්ගොඩ හා ඉස්මත්තේ හේන්කෙටු කැලෑ රොදවල් පුරාණ ගමක මූලික අංශයෝය. ගමේ නම වැවෙන් බිදිණ. තඹුත්ත වැවඅසබඩ ගම තඹුත්තේ ගම, මුසල්පිටි වැව අද්දර මුසල්පිටිය යනුවෙනි. ඒ පුරාණ ගම් බොහෝ විට එකිනෙකින් වාගේම සිදදියෙන් ඇත්ව පැවතිණ. කන්තෝරු වලින් ඇත්ව



මහවැලියේ ගොවියෙක් මංසැලක නතරවී

ගමේ කටයුතු බොහොමයක් ගම මුම කර ගත්හ. වරිග සභා, ගම් සභා හා රට සභා ආදී පුරාණ ජන සන්නිපාත නීතිය හා සමාජ මෙන්ම ආවාහ විවාහ, ඉඩම් බුක්තිය හා ගමේකම ආදිය තීරණය කළේය. ඉඳහිට ගමට පිටින් එන මුදලාලිලා ගමේ අයට ඇඳුම්, අරුමෝසම් බඩු ආදිය විකුණා ඒ සඳහා දඩමස්, පැණි සහල් හා තල මෙනේරි වැනි දේවල් හුවමාරු කර ගත්හ. ආණ්ඩුව මේ ගම්වල එදිනෙද වැඩවලට ඇඟිලි ගැසුවේ යන්තමිනි. ආණ්ඩුව වැව් අළුත්වැඩියා කිරීමට මුදල් හදල් දුන්නද බොහෝ විට ගම්මු තමන්ගේම කයිය අත්තම අනුව ඒ වැඩ කරගත්හ.

මේ පුරාණ ස්වයංපෝෂිත ගොවිතැන් ක්‍රම හා සමාජ චාරිත්‍ර ක්‍රමයෙන් වෙනස් වූයේ මහ ආණ්ඩුව ක්‍රමයෙන් තම වැඩ කටයුතු වල ප්‍රමාණය වැඩි කිරීමට පෙළඹුමත් සමගය. ආණ්ඩුව, ඈත පළාත් වල ජීවත්වන ගැමියන්ගේ සුභසාධනය, එනම් ගොවිතැන් කටයුතු වල වාගේම සමාජයේ නොයෙක් වෙනස්කම් ඇතිකොට එම හුදකලා ගම් ජාතියේ ආර්ථික සාමාජික හා සංස්කෘතික අංග හා එක්කාසු කිරීමට උනන්දු වීම නිසා, සෑහෙන කාලයක් හුදකලාව තිබූ පුරාණ ගම් හදිසියේ විශාල පෙරලි වලට මුහුණ දුනි. මේ මහවැලි කථාවේ එක් පැත්තකි. අනික් පැත්තෙන්, ඈත ප්‍රදේශ වලින් ඇවිත් මහවැලියේ සරු පොළවේ ආණ්ඩුවේ පිහිට ලබාගෙන තමන්ගේ අනාගතය සරුකර ගැනීමට උත්සාහ ගන්නා ගොවියෝ, තමන් අතට ලැබුණු අළුත් ඉඩම් ගොවිතැන් කොට සංවර්ධනයට අතදෙති.

වියළි කලාපයේ සංවර්ධනයට ඇති මූලික බාධාව ගොවිතැනට සෑහෙන පමණ වතුර නැති වීමයි. වතුර කලට වේලාවට ඇත්නම් ඒ රත් පොළවේ වවන්නට බැරි දෙයක් නැත. මේ නිසා ආණ්ඩුව මහවැලිය හරවා ඉංජිනේරු මහා විස්කම් කොට නොයෙකුත් මඩිචම් වලින් වතුර හැමටම ලැබෙන සේ කටයුතු කරයි. දැන් මහවැලි අඩවි වල හැම තැනම වතුර පාලනය කිරීමට හද ඇති විශාල ඇලවල් හා ඒවායේ වතුර හසුරුවන විශාල දොරටු කොටත් දැකිය හැක. ඒ විතරක් නොවේ, අළුත් ක්‍රමයට හැමෝටම අක්කර දෙකක් මඩින්ද අක්කර භාගයක් ගොඩින්ද දී ගොඩ ඉඩමේ ගෙවල් හදන්නට

ආධාරද දී ඇත. මේ නිසා අළුත් ගම්මාන බිහිවෙමින් තිබේ. දැන් පුරාණ ගම් වෙනුවට අළුත්, ගම්මාන, ඇළමාර්ග, වතුර හැරවීම. ඉඩම් දියුණු කිරීම හා යළි පදිංචි කිරීම දක්නට ඇත. මේ සඳහා පිටරටවලින් විශාල වශයෙන් ආධාර ලැබේ.

මෙවගේ අළුත් පන්නයට එන ගොවිතැන් විධි වලින් බලාපොරොත්තු වෙන්නේ ගොවිතැනේ දියුණුවයි. එමගින් රටේ මහජනතාවගේ අභිවෘද්ධියයි. මේ වගේ දියුණුවක් ලැබීමට පවුලට ගමට, සීමාවුණු පුරාණ ගොවිතැන් විධි හෝ පුරාණ සිරිත් විරිත් වලින් වට වුණු හුදකලා ගම් ගොඩවල් ප්‍රමාණවත් නොවන බව කීමට පවා අවශ්‍ය නැත. මේ නිසා පුරාණ ගම, මුල්, කරගෙන තිබුණු යැපීම් ගොවිතැනින් මිදී යන්ත්‍ර උපකරණ යොද ගෙන කරන ගොවිතැන් වලට මාරු වීම අවශ්‍ය වෙයි. එය මේ සංවර්ධනයට අතහිත දෙන ආණ්ඩුවේද පරමාර්ථ යයි. මේ අළුත් ගොවිතැන් ක්‍රම යොද ගැනීම ඉතා වැදගත් වන්නේ අළුත් ජනපද සෑදීම සඳහා වියදම් කරන ලද විශාල ධනස්කන්ධය පියවා ගෙන ජාතියට ආහාර නිෂ්පාදනය වැඩි කිරීම අප කාගේත් ව්‍යායාමය වියයුතු නිසාය.

මේ හදිසි අවශ්‍යතාව නිසා දැන් දැන් තරමක් දුරට සමාජ හා සංස්කෘතික දියුණුවට වඩා ආර්ථික දියුණුවට වැඩි තැනක් දෙන බව පෙනේ. මේ දියුණුව මූලික වශයෙන් දැන් පිටස්තර වෙළඳාම ඉලක්ක කරගත් ගොවිතැනින් පැන නැගෙන නිසා ගැමි ජනතාව ක්‍රමයෙන් මුදල් ආර්ථිකයට ඇතුල් වෙති. මෙවැනි අර්ථ ක්‍රමයක විශේෂ ලක්ෂණය වන්නේ පෙරදී මෙන් නොව ගොවීන් විසින් තමාගේ යැපීමට අමතරව උපයන දේ මුදලට ගැනීමට වෙළෙන්දෝ ප්‍රදේශයට පැමිණීමය. එහෙම නැත්නම් ප්‍රදේශයේ ජනතාව තුළින්ම ඒවගේ වෙළඳුන් බිහිවීමයි. පැරණි පවුල තම ආර්ථික නිදහස සේ අළුත් වෙළඳාම් උපක්‍රම සමගම ක්‍රමයෙන් නැතිකර ගනී. මීට අමතරව පිටතින් ගේන පොහොර



රන් පොළොවේ උරුම ලද්දෝ: මහවැලියේ දරු පරපුරෙන් කොටසක්

වැනි දේ වැඩි වැඩියෙන් ලබා ගැනීමට උත්සාහ කරන අතර ගෙදර පාවිච්චියට ගන්නා අනේක විධියේ ද. තමන් උපයන වැඩිපුර ආදයමෙන් මිලට ගැනීමට පෙළඹේ. උපයන දේවල්වල ප්‍රමාණය වැඩි වීමත් ඒ සමගම වැඩිවෙන වෙළඳාමත් නිසා ගැමි ජනතාව ඉක්මණින් පිටස්තර ලෝකය සමග සම්බන්ධ වෙති. මේ බාහිර සම්බන්ධකම් නිසා අන්තිමේදී යැපීම් ගොවිතැන් කරන පුංචි ගොවි පවුල් වෙළඳ අර්ථ ක්‍රමයට කෙලින්ම සමබන්ධ වෙයි. ඒ විතරක් නොවේ. ඒ අය තමන්ගේ යැපීමට අවශ්‍ය දේවල් ලබා ගැනීමට සෑහෙන පමණ පිටස්තර ලෝකය සමග සම්බන්ධ වෙති.

මහවැලියේ ගැටළුද සංවර්ධන සලකුණුද මේ මහා වෙනස්වීම්වල පතිතව ඇත. වැඩි දියුණුවන පාරවල් හා යාන වාහන පහසුව, ගොවීන්ගේ උපයන දෑ වෙළඳපොලේ විකිණීම, ඒ මුදල් වලින් පිටස්තර ලෝකයේ නිපදවන බඩු මුට්ටු ගැනීම වැඩිවීම, වෙන එකක් තබා ගොවි තැනට අවශ්‍ය නොයෙක් දේ පිටින් ලබා ගැනීම වෙළඳ ආර්ථික ක්‍රමයක උපන සලකුණු කරයි. මෙය සංවර්ධනයේ හොඳ සළකුණකි. එහෙත් අනෙක් අතට ගොවි ජනතාවගේ අළුත් ප්‍රශ්නද මේ සලකුණු තුළින්ම හඳුනා ගතහැකි බව තදින්ම පෙන්විය හැක. වඩා පළල් අර්ථ ක්‍රමයකට මහවැලි ගොවීන් සම්බන්ධ වෙන විට එක සමාන ඉඩම් කැබලි හැමෝටම දීම. මහවැලි ව්‍යාපාරයේ වාසි නිදර්ශනයක් ලෙස වතුර එක සමානව බෙද දීම. අළුත් ගොවිතැන් ක්‍රම වැනි දේ හඳුන්වා දෙන විට ගොවීන් සැමදම එකම ප්‍රමාණයේ සමාන ආදයම් දේපල පෙන්නුම් කරතියි විශ්වාස කළ නොහැක. ඒ ගොවීන් අතර ආදයම් අතින් නොයෙක් උස් පහත්කම් ඇතිවීම ස්වාභාවිකය, මීට අමතරව හොරෙන් තම ඉඩම් උගස් තැබීම, දුප්පත්කම, ආහාර අහේනිය. මීළඟ පරම්පරාවේ ළමයින්ට ඉඩම් හිඟවීම වැනි කාරණා නිසා ආර්ථික අතින් විතරක් නොව සමාජ දේශපාලන අතින්ද විෂමතා ඇතිවීමට ඕනෑතරම් ඉඩකඩ ඇත. මේ ප්‍රශ්න ගැන මහවැලියේ නිලතල දරන උදවිය සෑහෙන පමණ දැන සිටී. එසේ ඇතිවිය හැකි ප්‍රශ්න ගැන බලා වාර්තා කිරීමට පමණක් නොව හැකි තරම් දුරට ගොවීන්ගේ මූලික සමානකම් තව දුරටත් පවත්වා ගෙන යාහැකි මාර්ග යොයා බැලීමට ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වැනි ස්ථාන වල සිටින විවිධ විශේෂඥයන්ගේ සහායද පතති.